කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **04** WW/O/22/10/23/01
වර්ණය : ඇම්බර්

## තද සුළං සහ මුහුද රළුවීම පිළිබඳ අවවාදාත්මක නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2022 ඔක්තෝම්බර් මස 24 දින ප.ව.4.30 තෙක් වලංගු වන පරිදි
2022 ඔක්තෝම්බර් මස 23 දින ප.ව. 4.30 ට නිකුත් කරන ලදී.

**බෙංගාල බොක්ක ගැඹුරු මුහුදු ප්‍රදේශ සහ අන්දමන් මුහුදේ ක්‍රියා කරන බහුදින ධීවර යාත්‍රා සඳහා.**

### සැලකිලිමත් වන්න!

**උතුරු අන්දමන් මුහුද ආශ්‍රිතව පැවති පීඩන අවපාතය ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී අද උදෑසන අක්ෂාංශ 15.60N සහ දේශාංශ 88.40E (නැගෙනහිර මධ්‍යම බෙංගාල බොක්ක) ආසන්නයේ ස්ථානගතව පැවතුනි.**

එය වයඹ දෙසට ගමන් කර මධ්‍යම බෙංගාල බොක්ක ආශ්‍රිතව සුළි කුණාටුවක් දක්වා තවදුරටත් වර්ධනය වීමට ඉඩ ඇත. අනතුරුව, එය උතුරු-ඊසාන දෙසට ගමන් කර ඔක්තෝබර් 25 වනදා පමණ බංගලාදේශ වෙරළ තීරය හරහා ගමන් කිරීමට බොහෝ දුරට ඉඩ ඇත.

උතුරු අක්ෂාංශ 12 ත් 20 ත් සහ නැගෙනහිර දේශාංශ 85 සහ 100 ත් අතර මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී. (60-70) පමණ වන අතර විටින් විට පැ.කි.මී. 80 දක්වා වැඩිවිය හැක. මෙම මුහුදු ප්‍රදේශ රළු හෝ ඉතා රළු වන අතර තද වැසි හෝ ගිගුරුම් සහිත වැසිද ඇතිවිය හැක.

සුළි කුණාටුවේ අපේක්ෂිත ගමන් මාර්ගය **(Source: RSMC India)**



කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## පද්ධතියේ ගමන් මාර්ගය පිළිබඳ අනාවැකිය

| දිනය/ වේලාව (/. ලං. ස. වේ.)(පැය) | පිහිටීම ( අක්ෂාංශ/ දේශාංශ) | උපරිම සුළං වේගය ( පැ.කි.මී) | වර්ගය |
|---|---|---|---|
| 23.10.2022/11.30 | 16.2/87.9 | 55-65, 75 දක්වා වැඩි විය හැක | ගැඹුරු පීඩන අවපාතය |
| 23.10.2022/17.30 | 16.9/87.7 | 60-70, 80 දක්වා වැඩි විය හැක | සුළි කුණාටුව |
| 23.10.2022/23.30 | 17.7/88.0 | 65-75, 85 දක්වා වැඩි විය හැක | සුළි කුණාටුව |
| 24.10.2022/05.30 | 18.6/88.5 | 75-8, 95 දක්වා වැඩි විය හැක | සුළි කුණාටුව |
| 24.10.2022/17.30 | 20.4/89.5 | 85-95, 105 දක්වා වැඩි විය හැක | චණ්ඩ සුළි කුණාටුව |
| 25.10.2022/05.30 | 22.3/90.6 | 90-100, 110 දක්වා වැඩි විය හැක | චණ්ඩ සුළි කුණාටුව |
| 25.10.2022/17.30 | 24.0/91.7 | 45-55, 65 දක්වා වැඩි විය හැක | පීඩන අවපාතය |

**අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:**

- **උතුරු අක්ෂාංශ 12 ත් 20 ත් සහ නැගෙනහිර දේශාංශ 85 සහ 100 ත් අතර මුහුදු ප්‍රදේශයට 2022 ඔක්තෝබර් 25 වනතෙක් කාලය තුල යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**
- **දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩ බිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.**
- **කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**